# මැතිවරණයේදී මා මධ්‍යස්ථයි

ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින්
රටේ වත්මන් දේශපාලන තත්ත්වය පිළිබඳ කරන ලද
පැහැදිලි කිරීම

2015. 07. 14
**ජනාධිපති කාර්යාලයේ දී**

12 JAN 2016

# මැතිවරණයේදී මා මධ්‍යස්ථයි

**ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් රටේ වත්මන් දේශපාලන තත්ත්වය පිළිබඳ කරන ලද පැහැදිලි කිරීම**

2015. 07. 14 වන දින
ජනාධිපති කාර්යාලයේ දී

| | |
|---|---|
| පරි. අංක | 6718 |
| වර්ග අංකය | 808.51 |
| දිනය | |

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

මගේ මතකයේ හැටියට පසුගිය වසරේ නොවැම්බර් මස 21 වැනිදා මේ වගේ හමුවීමෙන් පසු තමයි අද මේ විදිහට ඔබ හමු වෙන්නේ.

විශේෂයෙන් වර්තමාන දේශපාලන තත්ත්වය පිළිබඳ පැහැදිලි කිරීමක් කිරීමටයි මම බලාපොරොත්තු වන්නේ.

වර්තමාන දේශපාලන තත්ත්වය පිළිබඳ කතා කරන විට මම කාගේත් අවධානය යොමු කරනවා පසුගිය ජනවාරි මාසේ 08 වැනිදා මේ රටේ ජනාධිපතිවරයා වශයෙන් පත්වීමට, ප්‍රධාන වශයෙන්ම ජනතාවට ඉදිරිපත් කරන ලද මැතිවරණ ප්‍රකාශනයේ කරුණු පිළිබඳ අපි අවධානය යොමු කළයුතුයි කියන කාරණාවට.

ජනවාරි 08 වැනිදා මේ රටේ විශාල පරිවර්තනයක්, ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක් ඇතිවුණා. සාමාන්‍යයෙන් එවැනි පරිවර්තනයක් ඉතාම කෙටි කාලයකින්, ඒ කියන්නේ මම ආණ්ඩුවෙන් එළියට බැහැලා නොවැම්බර් 21 දා සිට ජනවාරි 08 වැනිදා වන විට දවස් 42 ක් වැනි කාලයකුයි තිබුණේ. දවස් 42 ක් වැනි කාලයකදී තමයි අපට රටේ අනාගතය සඳහා ප්‍රජාන්ත්‍රවාදය, නිදහස, මූලික අයිතිවාසිකම්, මානව හිමිකම්, නිදහස් මාධ්‍ය මේ සියල්ල පෝෂණය කිරීම සඳහා අලුත් ආණ්ඩුවක් හදන්න පුළුවන්කම ලැබුණේ.

එහිදී මම ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රකාශනය, විශේෂයෙන්ම මෛත්‍රී පාලනයක් පිළිබඳ මම සිහිපත් කරන්නට ඕන. මේ ප්‍රකාශනය බොහොම වැදගත් ප්‍රකාශනයක් ලෙස අපේ රටේ මහජනතාවට ඉදිරිපත් කළා. මේ ප්‍රකාශනයේ තිබෙන කරුණු වගේම එදා පොදු අපේක්ෂකයා ලෙස මාව තෝරා ගැනීමට මූලික වූ පසුබිමක් ද තිබුණා.

අවුරුදු 49 ක මගේ දේශපාලන ජීවිතයේ අත්දැකීම් සමඟ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක්, ඇමතිවරයෙක් වශයෙන් කටයුතු කළා, ඒ අවුරුදු 49ක කාලය තුළ මේ රටේ පොදු ජනතාව තුළ මම විශ්වාස කරනවා, මා පිළිබඳ පෞද්ගලික පිළිගැනීමක් තිබුණා, මම දූෂිතයෙක් නොවේ. ඒ වගේම පැහැදිලි ව ම නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන කෙනෙක්. ඒ වගේම තමන්ට ලැබෙන බලය වැරැදි ලෙස භාවිතා නොකරපු කෙනෙක්. ඒ නිසා මම මේ තනතුරට සුදුසුයි කියන මතය පොදු ජනතාව තුළ තිබුණා. මගේ චරිතයත්, මගේ පෞරුෂත්වයත්, මගේ දීර්ඝකාලීන දේශපාලන අත්දැකීම් සමඟ ගොඩනඟාගෙන තිබුණු දේශපාලන ප්‍රතිරූපයත්, කෙරෙහි ජනතාවගේ විශ්වාසයක් සහ බලාපොරොත්තු රැඳී තිබුණා.

ඒ වගේම ඒ විශ්වාසය සහ බලාපොරොත්තු සමඟ මම ඒ කාලයෙත් කිච්චා ප්‍රධාන වශයෙන්ම මැතිවරණයට මම ඉදිරිපත් වෙලා පොදු අපේක්ෂකයා ලෙස තෝරා ගන්න අවස්ථාව වන විට දී හෝ මැතිවරණ ව්‍යාපාරය තුළ දී හෝ, නොවැම්බර් 21 වැනි ද ආණ්ඩුවෙන් එළියට බහින්න කලින් එක දවසක දී වත්

හෝ රනිල් වික්‍රමසිංහ මහතා හමු වෙලා තිබුණේ නැහැ. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණිය එක දවසක් හමුවෙලා පැයකට අඩු කාලයක් සාකච්ඡා කළා. ඒ වගේම අපි මැතිවරණ ප්‍රකාශනයත් එක්ක සංවිධාන, දේශපාලන පක්ෂ, කණ්ඩායම් 49 ක් අත්සන් කෙරුවා.

ඒ කණ්ඩායම් 49යේ වැඩ කළ අය වැඩි පිරිසක් මම පෞද්ගලිකව දැනගෙන හිටියෙත් නැහැ. එතකොට මැතිවරණ ප්‍රකාශනය හැදුවෙත්, මැතිවරණ ව්‍යාපාරය සකස් කළෙත්, ඒ අත්සන් කළ සංවිධානවල නියෝජිතයන් ප්‍රමුඛව ප්‍රධාන පිරිස්. ඒත් එක්කම එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛව ජෙනරාල් සරත් ෆොන්සේකා මහතාගේ එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, ඒ වගේම මුස්ලිම් කොංග්‍රසය, මුස්ලිම් ජාතික පෙරමුණ, ජාතික හෙළ උරුමය, ද්‍රවිඩ ජාතික සන්ධානය ගිවිසුමක් නැතිව, ජනතා විමුක්ති පෙරමුණ ගිවිසුමක් නැතිව ඒ විදිහට විශාල සහයෝගයක් ලබා දුන්නා.

ඒ ලැබුණු සහයෝගය තුළ අපට ජයග්‍රහණය ලබාගන්න පුළුවන්කම ලැබුණා. ඒ ජයග්‍රහණය ලැබිලා ඒත් එක්කම ජනවාරි 09 වැනිදා සන්ධ්‍යාවේ, මේ වගේ වෙලාවක ජනාධිපතිවරයා විදිහට දිවුරුම් දීලා, මැතිවරණ ප්‍රකාශනයේ තිබුණු කරුණු සහ මම ඇති කරගත් එකඟතාවය ක්‍රියාත්මක කිරීමේ වගකීම මා වෙත පැවරුණා.

මම ජනාධිපති ධූරයේ දිවුරුම්දීලා ඉතාම සුළු මොහොතකින් රනිල් වික්‍රමසිංහ මහතාව අගමැති විදිහට පත්කළා. මම ජනවාරි

08 වැනිදා ට කලින් අත්සන් කළ එකඟතා දෙකක් තිබුණා. ඒ දෙකින් එකක් තමයි මේ මැතිවරණ ප්‍රකාශනයට අදාළ කරුණු සම්බන්ධයෙන් ඉහත පක්ෂ, සංවිධාන, කණ්ඩායම් 49ක් එකතුව අපි අත්සන් කළ ප්‍රකාශනය.

ඊළඟට අත්සන් කරලා තිබුණ එකම දේ තමයි මම ජනාධිපති ධූරයට පත්වෙලා රනිල් වික්‍රමසිංහ මහතාව අගමැති ධූරයට පත්කරනවා යන්න. ඒ අනුව මම දිවුරුම් දීලා සුළු මොහොතකින් මම රනිල් වික්‍රමසිංහ මහතාව අගමැති ධූරයට පත්කළා.

රනිල් වික්‍රමසිංහ මහතා අගමැති ධූරයට පත් කරනකොට පාර්ලිමේන්තුවේ තත්ත්වය කුමක්ද, පාර්ලිමේන්තුවේ මන්ත්‍රී සංඛ්‍යාව 225 යි. රනිල් වික්‍රමසිංහ අගමැති කරනකොට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු සංඛ්‍යාව 47 යි. 225 ක් ඉන්න පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 47 දෙනෙක් ඉන්න පක්ෂයේ නායකයා මම අගමැති විදිහට පත් කෙරුවා. දැන් අද පවතින දේශපාලන වාතාවරණය තුළ මට ඇතැම් අය, මාව බලයට පත් කරපු අය, මාගේ හිතවතුන් ලෙස දෝෂාරෝපණ එල්ල කරනවා සහ චෝදනා පත්‍ර දෙනවා මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ධූරය භාරගත් එක වැරදියි, ඒක භාරගන්නේ නැතිව ඉන්නයි තිබුණේ කියලා.

දැන් පාර්ලිමේන්තුවේ 225 න් 47 ක් තියෙන පක්ෂයේ නායකයා අගමැති කරලා. ඒ එක්කම මේ අත්සන් කළ එකඟතාවය තුළ මගේ නම් කැමැත්ත තිබුණේ, මේ අත්සන් කිරීමට පෙර ජනවාරි

09 වැනිදා දිවුරුම් දීලා, 10 වැනි ද පාර්ලිමේන්තුව විසුරුවන්නයි. ඒක තමයි පහසුම දේ විදිහට මම දැක්කේ.

නමුත් මේ ප්‍රකාශනය සකස් කළ, මැතිවරණ ව්‍යාපාරය, සංවිධානය කළ, ඒ සියලු ඒකාබද්ධ සංවිධානවල එකඟතාවය සහ තීන්දුව පාර්ලිමේන්තුව විසුරුවන්නේ නැතිව දින 100ක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. මේ දින සියයේ වැඩපිළිවෙළ යන්න ඔබ දන්නවා එහි කාර්යභාරය තුළ එසේ මෙසේ දෙයක් නොවේ තිබුණේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න, මම ජනතාවට දුන් පොරොන්දුව විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම හෝ එහෙම නැත්නම් බලතල අඩු කරලා පාර්ලිමේන්තුවට, ස්වාධීන කොමිෂන් සභාවලට, අනිත් ආයතනවලට, ඇමති මණ්ඩලයට දෙන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ධුරය භාරගත්ත එක මම කරපු බරපතල වැරැද්දක් කියලා චෝදනා කරන මගේ මිත්‍රයින්ගෙන් දැන් මම අහන ප්‍රශ්නය මේ 47 දෙනෙක් ඉන්න පක්ෂයේ නායකයා අගමැති කරලා කියනවා මට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න 19 වැනි සංශෝධනය, විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම හෝ බලතල කප්පාදු කිරීම කරන්න කියලා. මම මේ තනතුරට එන්න කලින් අත් දෙකම ඔසවගෙන ආවේ තනතුර අහෝසි කිරීම හෝ බලතල කප්පාදු කිරීම යන ඕනෑම එකකට මම එකඟය කියලා. මම එදත් එහෙමයි, අදත් එහෙමයි, හෙටත් එහෙමයි. ඒක තමයි මගේ ප්‍රතිපත්තිය. මේ රටේ නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා රටේ පොදු මහජනතාව වෙනුවෙන්.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති ධූරය මම භාරගත්තේ ජනවාරි 16 වැනි දා. එයත් මම බලෙන් භාරගත්තේ නැහැ, මම ඉල්ලුවෙත් නැහැ. මට භාරගන්න කියලා ආරාධනා කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් රැසක් කිව්වා මහින්ද රාජපක්ෂ මහතාව හමු වෙමුයි කියලා. තමුන්නාන්සේලා දන්නවා කථානායකතුමාගේ නිල නිවසේ විනාඩි 10 ක 15 ක සාකච්ඡාවක් කළා පක්ෂය භාරගන්න කිව්වා. මම කිව්වා කැමතියි කියලා. පහුවදා මධ්‍යම කාරක සභාව, විධායක සභාව රැස් වුණා. භාරදුන්නා.

පාර්ලිමේන්තුවේ 2/3ක බලය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධානයට තිබුණා. එතකොට මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සභාපතිවරයා. ඒ නිසා පාර්ලිමේන්තුවේ 2/3ක බලයක් තිබෙන මන්ත්‍රීවරුන් 142 ක් නියෝජනය කරන එක්සත් ජනතා නිදහස් සන්ධානයෙත්, මම නායකයා වුණා, සභාපති වුණා. ඒ නිසා මේ දින සියයේ සාර්ථකත්වය ගන්න පුළුවන් වුණා. 19 වන සංශෝධනය පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට පුළුවන් වුණා. ඒ විතරක් නොවෙයි. අද එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛව සියලුදෙනා කතා කරන ජනතාවට දුන් සහන, රජයේ සේවකයන්ට පඩි වැඩි කිරීම, තෙල් මිල, ගෑස් මිල, බඩු මිල අඩු කිරීම ඒ සියල්ලම කරන්න පුළුවන්කම ලැබුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, සන්ධානයේ සභාපති ධූරය මම භාර අරගෙන, මේ මැතිවරණ ප්‍රකාශනයේ තිබෙන කරුණු ඉෂ්ට කරන්න, සන්ධානය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මම මෙහෙය වූ නිසයි.

මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති නොවී මහින්ද රාජපක්ෂ මහතා සභාපති විදිහට හිටියනම්, 19 වැනි සංශෝධනය සම්මත කරන්න ඒගොල්ලෝ දෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ මුදල් ඇමතිවරයාගේ අය වැය යෝජනා සම්මත කළේ ඒකච්ඡන්දයෙන්. මහින්ද රාජපක්ෂ මහතා සභාපතිකමේ හිටියනම් ජනතාවට ලබා දුන් මේ සහන, බඩු මිල අඩු කිරීම්, තෙල් ගෑස් මිල අඩු කිරීම්, පඩි වැඩි කිරීම් මේ කිසි දෙයක් කරන්න ඒ අය වැය යෝජනා සම්මත කරන්න දෙන්නේ නැහැ.

අද අපි මේ දින 100 සාර්ථකත්වය ගැන කතා කරනවා. එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛව මගේ ජයග්‍රහණයට වැඩ කළ සංවිධාන, පක්ෂ 49 ක් මේ වැඩපිළිවෙළ නිර්මාණය කළා වගේම, ඒ නිර්මාණය කළ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේදී එහි මුළු ගෞරවය පාර්ලිමේන්තුවේදී ඊට සහයෝගය දුන්න, අත උස්සපු සියලු දෙනාට ම දෙනවා.

19 වැනි සංශෝධනයට 225 න් 215 ක් ඡන්දය පාවිච්චි කළා. මම කියන දේවල් නොකරන කෙනෙක් නෙමෙයි. ඒ වගේම දූත් සමහරුන් මේ දවස්වල මට කියනවනේ දුෂ්ටයා, ද්‍රෝහියා, පාවාදෙන්නා කියලා. මේ ප්‍රජාතන්ත්‍රවාදයේ මල් පිපිලා. ප්‍රජාතන්ත්‍රවාදය දෝරේ ගලා යනවා ජනවාරි 08 වෙනිදායින් පස්සේ. මේ රටේ විධායක ජනාධිපති ධූරය 1978 හදපු දවසේ ඉඳලා ජනවාරි 08 වැනිදා වනතුරු මේ රට පාලනය කළ රාජ්‍ය නායකයන්, ජනාධිපතිවරුන් ඒ කිසිකෙනකුට මේ සුමානයේ දෙකේ මට ගහන ගැහිල්ල ගහලා නැහැ.

ඒ එක් එක් යුගවල මාධ්‍යවේදීන්ට සිදු වුණු දේවල්, මාධ්‍ය හිර කරපු ආකාරය, නිදහස් මාධ්‍ය වළලපු ආකාරය මම ඒවා කියන්න කාලය ගන්නේ නැහැ. ඔබ වගේම මේ රටේ විශේෂයෙන්ම විධායක ජනාධිපති ධූරය හදපු දවසේ ඉඳලා මේ රටේ වුණු දේවල් දන්න සියලුදෙනාම ඒ ගැන දන්නවා.

සමහර වෙලාවට මට හිතෙනවා එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක මැතිතුමා 1956 පොදු ජන ආණ්ඩුව පිහිටුවලා, රට ප්‍රජාතන්ත්‍රවාදී කරලා, කම්කරු අයිතිවාසිකම් දීලා, නිදහස දීලා, ප්‍රගතිශීලී අණ පනත් සම්මත කරලා, මහ පරිවර්තනයක් රටේ කරනකොට එතුමා අවුරුදු තුන හමාරයි ආණ්ඩු කළේ. වැඩ වර්ජන 459 යි.

බණ්ඩාරනායක මැතිතුමාගේ කැබිනට් මණ්ඩලයත් කැබිනට් එක වර්ජනය කෙරුවා. ඇමති මණ්ඩල රැස්වීම වර්ජනය කෙරුවා. වැඩ වර්ජන එක දිගට යනකොට ඊට කළින් හිටපු අගමැති සර් ජෝන් කොතලාවල මැතිතුමා කිව්වා 'මම බැඳපු බල්ලෝ බණ්ඩා ලෙහලා දැම්මා' කියලා. දැන් බණ්ඩාට හපා කනවා කිව්වා.

ජනවාරි 08 වැනිදා මේ රටේ ජනතාව සිදු කළ පරිවර්තනයට නායකත්වය දුන්න, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පැහැදිලි ලෙස ස්ථාපිත කළ ඒ සඳහා වගකීම් අරගෙන කටයුතු කළ මට, මේ ඇතැම් මාධ්‍ය ආයතන සහ ඇතැම් දේශපාලන විවේචකයන්, විචාරකයන් මේ අත තද කරල ලියනකොට ද්‍රෝහියා, දුෂ්ටයා, පාවා දෙන්නා කියලා කියනවා. මම ඒගොල්ලන්ට කියනවා ප්‍රජාතන්ත්‍රවාදයේ රස හොඳට භුක්ති විඳින්න. ජනවාරි

08 වෙනිදා කළ පරිවර්තනයෙන් මේ රටේ නිර්මාණය වූ ප්‍රජාතන්ත්‍රවාදී සමාජය විනාශ කරන්න එපා කියලා.

මේ රටේ ජනතාව විදිහට තමුන්නාන්සේලා ජනවාරි 08 වෙනි ද කලින් අද මට මේ පාවිච්චි කරන වචන පාවිච්චි කරලා තිබුණානම්, මට ගහන ගැහිලිවලින් සියයෙන් එකක් ගැහුවානම් ඒ ගහන අයට මොනවාද සිදු වෙන්නේ මොනවද කියලා මෙතෙක් සිදු වුණු දේවල් එක්ක හැම කෙනෙක්ම දන්නවා. ඒක තමයි ඇත්ත තත්ත්වය. රාජාණ්ඩුවක්නේ තිබුණේ. තමුන්නාන්සේලාගේ මාධ්‍ය ආයතනවලට කොහොමද උපදෙස් දීලා තිබුණේ ජනවාරි 08 වැනි ද කලින්. ඇමතිවරුන්ට ගහන්න ඕන තරම්, හැබැයි රාජපක්ෂ පවුලේ කාටවත් ගහන්න එපා.

ඉතින් මේ මාස 06 තුළ මේ රටේ ඝාතන නැහැ, ලේ වැගිරීම් නැහැ, මහ කෝලාහල නැහැ, මේ රට සාමකාමී, නිදහස්. ප්‍රජාතන්ත්‍රවාදී රටක්. ඉතින් මේ දේශපාලන කළමනාකරණය පාර්ලිමේන්තුවේ 225 ක් ඉන්න තැන 47 කින් අගමැති කෙනෙක් පත් කරගෙන, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරලා, අය වැය ඒකමතිකව සම්මත කරලා, මේ සියල්ල එක්ක විශේෂයෙන්ම යන විට මේ රටේ සිදුවිය යුතු අවශ්‍ය වෙනස්කම් පැහැදිලි ලෙස කිරීමේ අවශ්‍යතාව මට තිබුණා.

මේ සිදුවීම් එක්ක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ සන්ධානය තුළ අර්බුද ඇති වුණා. මහින්ද රාජපක්ෂ මහතා මට පක්ෂය භාරදුන්නට, භාර දීලා සුමාන දෙක යනකොට අනිත් පැත්තට හැරිලා කකුලෙන් අදින්න පටන් ගත්තා. දූෂණයෙන්, වංචාවෙන්

එවැනි පුද්ගලයන්ගෙන් තොර, අවස්ථාවාදීන්ගෙන්, රාජ්‍ය දේපළ මංකොල්ල කන මිනිස්සුන්ගෙන්, බලය වැරදි විදිහට පාවිච්චි කරන අයගෙන්, පවුල්වාදයෙන් තොර නිර්මල, පිවිතුරු, පවිත්‍ර පක්ෂයක් විදිහට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනගන්න මම විශාල උත්සාහයක් අරගෙන තමයි කටයුතු කළේ.

එක් පැත්තකින් පාර්ලිමේන්තුවෙන් 47 ක් ඉන්න නායකයෙක් අගමැති කරලා ආණ්ඩුවක් ගෙනියන්න ඕන. අනෙක් පැත්තෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න ඕන. මම කියපු ඒ වෙනස්කම් කරන්න ඕන පාර්ලිමේන්තුවේ කැමැත්ත අරගෙන.

ඊළඟට මට විරුද්ධව සන්ධානයේ නායකයෝ රට පුරා රැස්වීම් තියන්න පටන් ගත්තා රට පුරා රැස්වීම් තියලා කියන්න ගත්තා මේකට 10ක් නැග්ගා, අරකට 25ක් නැග්ගා, මේකට 40ක් නැග්ගා, මේකට 50 ක් නැග්ගා කියලා. කාටද මේ අභියෝගය කළේ ? මේ අභියෝගය කළේ එක්සත් ජාතික පක්ෂයට නොවේ. ඒ අභියෝගය කළේ කවුරුත් දන්නවා මටයි කියලා.

එතකොට එක පැත්තකින් කියනවා ඇයි මේ විනය ක්‍රියාමාර්ග ගන්නේ නැත්තේ ඇයි. මේ මන්ත්‍රීවරුන්ට චෝදනා පත්‍ර දෙන්නේ නැත්තේ කියලා. ජාතික ආණ්ඩු සංකල්පයට පක්ෂයේ මධ්‍යම කාරක සභාව ඒකමතිකව එකඟතාවය පළ කළා. පාර්ලිමේන්තු කණ්ඩායම ඒකමතිකව තීන්දු ගත්තා. කිසිම විරෝධයක් නැතිව. නමුත් එහෙම තීන්දු අරගෙන විරුද්ධව කටයුතු කරනකොට පක්ෂය තුළිනුත් කිව්වා, රටෙනුත් කිව්වා දේශපාලන ප්‍රතිවාදීනුත් කිව්වා ඇයි මේ විනය පරීක්ෂණ

කරන්නේ නැත්තේ ඇයි මන්ත්‍රීවරු සංවිධායකකම්වලින් අස් කරන්නේ නැත්තේ, ඇයි ඔගොල්ලන්ට විනය පරීක්ෂණ කරලා මන්ත්‍රී ධූරවලින් ඉවත් කරන්න කටයුතු කරන්නේ නැත්තේ කියලා. විනය පරීක්ෂණ කරන්නෙ කොහොමද, සංවිධායක ධූරවලින් අස් කරන්නේ කොහොමද. ඇයි මේ පාර්ලිමේන්තුව ගෙනියන්න ඕනේ 47 ක මන්ත්‍රීවරුන් ඉන්න අගමැතිවරයෙක් එක්ක. පනතක් සම්මත කරන්න ඕනේ පාර්ලිමේන්තුවේ. පනත් සම්මත කිරීම, ව්‍යවස්ථා සංශෝධනය, අය වැය යෝජනා සම්මත කිරීම සහ ස්වාධීන කොමිෂන් සභා ගේන්න පුළුවන්ද, ඒ එකක්වත් කරන්න බෑ. ඒ නිසා ඒ සියලු විනය විරෝධී වැඩ කරද්දී මේ දින 100 වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන්න මම භාරගත්ත. රටේ ජනතාවගේ වගකීම් ඉටු කරන්න මම ඒවා නොදක්කා වගේ හිටියා. මම ඉතාම නම්‍යශීලී වුණා. මම දන්න විදිහට මේ රටේ කිසිම රාජ්‍ය නායකයෙක් මේ විදිහට නම්‍යශීලී වෙලා නැහැ තමන්ගේ පක්ෂයේ ඉන්න පිරිස් මේ විදිහට හැසිරෙනකොට. ඒ නම්‍යශීලී වුණේ ජනතාවට දුන් ප්‍රතිඥාව, ඉෂ්ට කරන්න. මැතිවරණ පොරොන්දු ඉෂ්ට කරන්න. ජනාධිපති ධූරයේ බලතල ඉවත් කරන්න. ජනතාවට දුන් පොරොන්දු ඉෂ්ට කරන්න. පරදින අය වැය සම්මත කරන්න. ඒවට තමයි ඒ විදිහට සහයෝගය දුන්නේ.

ඉතින් මේ සියල්ල එක්ක ගත්තහම අපි දන්නවා මේ පසුබිමත් එක්ක අපි අද මහ මැතිවරණයකට ගිහිල්ල තියනවා. මේ මහ මැතිවරණයේ ප්‍රතිඵල තුළ ප්‍රධාන වශයෙන්ම ඉදිරි අවුරුදු 05 ක මේ රටේ දේශපාලන ස්ථාවරත්වය, ඒ වගේම ආර්ථිකය පිළිබඳ ප්‍රධාන වගකීම, රට හැසිරවීම, කළමනාකරණයේ වගකීම

ප්‍රධාන වශයෙන් එන්නේ මේ මැතිවරණයෙන් බලයට පත්වෙන ආණ්ඩුවට.

මහින්ද රාජපක්ෂ මහතාට එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් නාම යෝජනා ලැබීම පිළිබඳව. මේ දවස්වල මට චෝදනා තුනක් එල්ල කරනවා. එකක් තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිකම භාර ගැනීම වැරැදියි කියලා, මම ඒකට උත්තර දුන්නා. අනෙක තමයි මහින්ද රාජපක්ෂ මහතාව හමුවීම වැරැදියි කියනවා. ඊළගට තුන්වනුව කියනවා අපේක්ෂකත්වය දුන්න එක බරපතල වැරැද්දක් කියලා.

මහින්ද රාජපක්ෂ මහතා මම හිතන්නේ ඔබ කවුරුත් දන්නවා අවස්ථා තුනක දී හමු වුණා. පළමු අවස්ථාව තමයි කථානායක නිල නිවසේදී පක්ෂය භාරගත්ත පළමු හමුවීම, දෙවැනි හමුවීම තමයි මුළු රටම දැක්කා දෙපාර්ශ්වයේම නියෝජිත පිරිස් ගිහිල්ලා පාර්ලිමේන්තුවේ ජනාධිපති කාර්යාලයේදී හමුවීම. ඒ හමුවට ඇවිල්ලා වාඩිවෙලා ඒ ආපු නියෝජිතයන් ඉස්සෙල්ලම පටන් ගත්තේ ඉදිරි මැතිවරණය එනවා කියලා. ඒකෙදී ඒ ඉල්ලීම් 04 ක් ඉල්ලුවා.

පළමු ඉල්ලීම මහින්ද රාජපක්ෂ මහතාව ඡන්දයෙන් පස්සේ අගමැති කරන්න. අගමැති අපේක්ෂකයා කරන්න. ඊළඟට ඒ දිනවල තිබුණු පසුබිමත් එක්ක, පාර්ලිමේන්තුවේ තිබුණු යම් යම් යෝජනාවලට විරෝධය පළ කරන්න. මේ වගේ කරුණු තමයි ඉදිරිපත් කළේ. මම මහින්ද රාජපක්ෂ මහතා හමුවෙලා පාර්ලිමේන්තුවේ කතා කළ සාකච්ඡාවේදී එකහෙළාම ප්‍රතික්ෂේප

කෙරුවා අගමැති ධුරය දෙන්න. අගමැති අපේක්ෂකයෙක් විදිහට පත් කරන්න මම කැමැතිත් නැහැ. කිසිසේත්ම මම මෙවට එකඟතාවයක් දක්වන්නේ නැහැ. එතකොට මගෙන් ඇහුවා ඇයි විරුද්ධ වෙන්නේ කියල. මම කිව්වා ජනවාරි 08 වැනිදා ලැබූ ජයග්‍රහණය ආපසු හරවන්න මට දෙන්න බැහැ කියලා.

අනිත් එක මම කිව්වා ඔබතුමා ඡන්දයකට ආපුහම ඡන්දයක් ජයග්‍රහණය කරන්න අවශ්‍ය මූලික කාරණා සම්පූර්ණ වෙන්න ඕන. මොනවද ඒ මූලික කාරණා. මම කිව්වා මේ රටේ දමිළ, මුස්ලිම් ඡන්ද හම්බවෙන්නේ නැහැ තමුන්නාන්සේ ඒ පක්ෂයෙන් තරග කළාම.

බලය වැරදි විදිහට පාවිච්චි කිරීමට එරෙහිව ඊළඟට මුළු ලෝකය පුරාම ගලා යන නව දේශපාලන සංස්කෘතිය. රටවල්වල තිබෙන දූෂණ විරෝධී රැල්ල. මේ රටේ උගත්, බුද්ධිමත් පිරිස් වගේම මධ්‍යම පාන්තික පිරිස් තුළින් ප්‍රධාන වශයෙන් මේ රටේ යහපාලනයක් සඳහා මාව පත් කරනකොට, ඒ තැබූ විශ්වාසය තුළ, මම කටයුතු කරනවිට ඒ පැත්තෙන් ඔබ සම්පූර්ණ වෙලා නැහැ. යහපාලනයට අවශ්‍ය සුදුසුකම ඔබ ලබලා නැහැ. අනෙක් පැත්තෙන් තරුණ පරපුර ඔබට ඡන්දය පාවිච්චි කරන්නේ නැහැ. ඔබේ පාලන කාලය තුළ සිදු කළ බරපතල වැරදි, රාජාණ්ඩු ක්‍රමය, වංචා දූෂණ හා පවුල්වාදය නිසා ඡන්දය පාවිච්චි කරන්නේ නැහැ. ඒ නිසා මැතිවරණයකට ඇවිල්ලා මේ පක්ෂය පරද්දන්න එපා කියලා මම කිව්වා. ඒ සාකච්ඡාව ප්‍රතිඵලයක් නැතිව අවසන් වුණා .

ඒ අතරවාරයේ අපි ආණ්ඩුව විදිහට, පාර්ලිමේන්තුව විදිහට කටයුතු කරගෙන ගියා. මැතිවරණය ඉතාම ආසන්න තත්ත්වයට ආවා. දැන් 19 වැනි සංශෝධනය සම්මත කරනවා. 19 වැනි සංශෝධන සම්මත කිරීමට ප්‍රධාන වශයෙන්ම ප්‍රමුඛව මටත්, එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, ද්‍රවිඩ ජාතික සන්ධානය, මුස්ලිම් කොංග්‍රසය, සරත් ෆොන්සේකා මැතිතුමාගේ පක්ෂය ඇතුළු මාව බලයට පත් කරපු ඒ සංවිධානවල ඔක්කොමටම වුවමනාව තිබුණා. බලයට පත්කිරීමත් එක්ක ඒ ආපු කාරණා තුළ ප්‍රධාන වශයෙන්ම බලයට පත් කරලා ඉදිරියට යාමේ කටයුතුවලදී 19 වැනි සංශෝධනය සම්මත කරන්න යනකොට ඇහුවා කෝ 20 කියලා. එතකොට මම කිව්වා දැන් 19 සම්මත කරන්න ගැසට් කරලා තිබෙන්නේ ඒ පිළිබඳ පවතින නීතිමය තත්ත්වය එක්ක දැන් 19යි 20 යි එකට යන්න බැහැ. 19 ගැසට් කරලා ඉවරයි, උසාවියට, ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා ඉවරයි. ඒ නිසා 20 අමුණන්න බැහැ. ඒ නිසා 20 වෙනම එන්න ඕනේ කිව්වා.

එතකොට සන්ධානයේ මන්ත්‍රීවරුන් කිව්වා අපි 19ට අත උස්සන්නේ 20 ගේනවා කියන පොරොන්දුව උඩ කියලා. මම රනිල් වික්‍රමසිංහ මහතා ඇතුළු ආණ්ඩුවේ අනිත් සියලුදෙනා එක්ක කතා කරලා සන්ධානයේ ඡන්ද ගන්නම් 19 ට, 20 ගේන්න ඕන. ඔව් ගේමු කිව්වා. එතකොට ඒ අනුව 19 ඉවරවෙලා දැන් මම බලාගෙන ඉන්නවා 20 එනකම්. 19 හැදුවේ මම නෙමෙයිනේ. මගේ පූර්ණ එකඟතාවයෙන් නීති විශාරදයන් සහ ඒ ඒ පක්ෂවල අය තමයි 19 හැදුවේ. දැන් මම බලනවා කෝ 20. ඒ එක්කම සන්ධානයේ මන්ත්‍රීවරු අහනවා කෝ 20. දැන් 20 හැළිලා.

එතකොට මට මතකයි මේ මැතිවරණ ප්‍රකාශනයත් එක්කම අපි සඳහන් කරලා තිබුණා 19 වගේම 20 ඒවගේම තොරතුරු දැන ගැනීමේ පනත, විගණන පනත මේවා බොහොම පැහැදිලිව මැතිවරණයෙත් කියපුවා.

විගණන පනත සහ තොරතුරු දැනගැනීමේ පනත හැදුවා. එතකොට 20, 19 හදපු අයගෙන් හැලුණා. තොරතුරු පනත නැහැ. විගණන පනත නැහැ. මේ රටේ වංචා දූෂණ පිළිබඳ රාජ්‍ය අංශය පිළිබඳ කතා කිරීමේදී, ප්‍රධාන වශයෙන්ම මේ රටේ ටෙන්ඩර් ක්‍රමය අන්ත දූෂිතයි. මම මේක මීට අවුරුදු 10 කට කලින් ඉඳලා කියලා කියනවා. ඒක රටම දන්නවා. ඒ නිසා තමයි මේ ටෙන්ඩර් ක්‍රමයේ තිබෙන දූෂණ වළක්වලා, මේ රටේ හොඳ මූල්‍ය කළමනාකරණයක්, දූෂිත ක්‍රමයෙන් තොර ටෙන්ඩර් ක්‍රමයක්, මූල්‍ය අංශවල හොඳ මූල්‍ය විනයක් ඇති කරන්න මේ විගණන පනත ගෙනාවේ.

දැන් මේ ප්‍රශ්නත් එක්ක අනෙක් පැත්තෙන් ආවා මහ බැංකු අධිපතිවරයා සම්බන්ධයෙන් පැමිණිල්ලක්. මේ පිළිබඳව කමිටුවක් පත් කරලා, එහි වාර්තාවක් ආවා. ඊළගට පාර්ලිමේන්තුවේ ගිණුම කාරක සභාවේ ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න පටන් ගත්තා. මගේ වගේම, රටේ පොදු ජනතාව අතරත් මතයක්, අදහසක් තියෙනවා රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා හොරකම් කරන කෙනෙක් නෙවේ, දූෂිතයෙක් නෙවේ කියලා. මේ මහ බැංකු අධිපතිවරයාගේ ඒ ප්‍රශ්නය ආවහම මේ පිළිබඳ වරින්වර කළ සාකච්ඡාවලදී මම අවසාන වරටත් එතුමාට කිව්වා ඔබතුමාට හොඳ නමක් තිබෙනවා, මේ සිද්ධියත් එක්ක තිබෙන පසුබිම තුළ

ඔබතුමා නිවැරැදි වෙන්න ඕන. ඒ නිසා හොඳම දේ තමයි මහ බැංකු අධිපතිවරයා ඉල්ලා අස්වෙන එක කියලා.

එතකොට මෙවැනි පසුබිමක් එක්ක තමයි නාම යෝජනා දක්වා අපි ආවේ. නාම යෝජනා දක්වා එනකොට මූලික වශයෙන් මම සඳහන් කරන්නට ඕන, මේ රටේ මැතිවරණයක් අවස්ථාවේදී ඒ, ඒ දේශපාලන පක්ෂවල තිබෙන ව්‍යවස්ථාවේ හැටියට, පක්ෂයේ ප්‍රතිපත්ති අනුව කොහොමද අපෙක්ෂකයන් තෝරන්නේ කියලා. එම ක්‍රියාවලිය සිද්ධ වෙන්නේ කොහොමද කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂකයින් තේරීමේ ක්‍රියාවලිය දන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අභ්‍යන්තරයේ ඉන්න අය. එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයන් තේරීමේ ක්‍රියාවලියේ ඉන්නේ එක්සත් ජාතික පක්ෂයේ අය. දේශපාලන පක්ෂවලත් එහෙමයි. එතකොට මේ අපේක්ෂකයින් තේරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී විශේෂයෙන්ම සඳහන් කරන්න ඕන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජනතා නිදහස් සන්ධානය කොහොමද අපේක්ෂකයන් තෝරන්නේ කියලා. ඉල්ලුම් පත්‍ර කැඳවනවා. නාම යෝජනා මණ්ඩල පත්කරනවා. ඊළඟට නාම යෝජනා මණ්ඩලයෙන් පස්සේ මධ්‍යම කාරක සභාව අනුමත කරනවා. මේක තමයි මේ තිබෙන ක්‍රමය. දූන් ඉතා පැහැදිලිව මේ තත්ත්වයත් එක්ක මහින්ද රාජපක්ෂ මහතාට අපේක්ෂකත්වය දීම පිළිබඳ මගේ කිසිදු එකඟතාවයක් නැහැ කියන එක මම සෑම කෙනෙක්ටම ප්‍රකාශ කළා.

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නායකයන්, දිනේෂ් ගුණවර්ධන, වාසුදේව නානායක්කාර, විමල් වීරවංශගේ පක්ෂය,

තිස්ස විතාරණ, ඩිව් ගුණසේකර, මහජන පක්ෂය, පොඩි අප්පුහාමි මහතාගේ පක්ෂය මේ පක්ෂ නායකයන් ඔක්කොම කිව්වේ මහින්ද රාජපක්ෂ මහතාට අගමැති අපේක්ෂකත්වය දෙන්න කියලා. මේ ශාලාවේ. මේ තිබෙන ලීවලට, බිත්තිවලට කතා කරන්න පුළුවන්නම් කතා කරලා කියයි මම කිව්වේ මොනවද කියලා. මම ඒ පක්ෂ නායකයන් සියලු දෙනාට කිව්වා මහින්ද රාජපක්ෂ මහත්තයට අගමැති අපේක්ෂකත්වය දෙන්නවත්, කණ්ඩායම් නායකත්වය දෙන්නවත් බැහැ කියලා. ඒ ගැන මම පැහැදිලිව ප්‍රකාශ කළා. ඒ අය නරක විදිහට මට බැණ බැණ තමයි මෙතනින් ගියේ.

එතකොට මේ තත්ත්වය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළත් තිබුණා. මම ඔය කිව්වේ සන්ධානය විදිහට. දැන් මේ තත්ත්වය එක්ක මට කළ හැකි කරුණු දෙකක් තිබුණා.

එකක් තමයි සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සන්ධානය මහින්ද රාජපක්ෂ මහතාට භාරදීලා මම අයින් වෙන එක. මම අයින් වුණානම් තත්පරයෙන් මහින්ද රාජපක්ෂ මහතාව සන්ධානයේ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා විදිහට ඒගොල්ලෝ පත් කර ගන්නවා.

මම දන්නවා මට සභාපතිකම දුන්නේ ජනවාරි 16 වැනි ද. ඊට සුමාන දෙකක් ගිහිල්ලා මහින්ද රාජපක්ෂ මහතා කියන්න පටන් ගත්තා අපරාදේ කරගත්ත වැඩේ. පක්ෂ නායකත්වය, සභාපතිකම දුන්න එක කියලා පසුතැවෙන්න පටන් ගත්තා. මම සම්පූර්ණයෙන් පක්ෂයෙන් ඉල්ලා අස් වුණානම් මහින්ද

රාජපක්ෂ මහතා මේ මැතිවරණයට එන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති හා සන්ධානයේ සභාපති විදිහට. ඒ විතරක් නොවේ, හදන අපේක්ෂක නාමාවලි සියයට සීයකම, සම්පූර්ණයෙන්ම එයාට ඕන විදිහට. ඒ විතරක් නෙවේ මාත් එක්ක හිතවත්ව හිටපු පාර්ලිමේන්තු කණ්ඩායම සමහරවිට ඔක්කොම, කපලා දාන්නත් තිබුණා. ඒ ඔක්කොම දොට්ට දානවා. එතකොට මේ තත්ත්වය උඩ, ප්‍රධාන වශයෙන්ම මේ බෙදීම තියනකොට මට කරන්න තිබුණ එකක් තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහ සන්ධානයේ සභාපතිකමෙන් අයින් වෙන එක. එහෙමනම් මහින්ද රාජපක්ෂ මහතා ඊයේ නාම යෝජනා දෙනකොට එන්නේ ඔයිට වඩා වෙනස් ආකාරයට, මම දන්නවා.

මම කියන්නේ නැහැ මහින්ද රාජපක්ෂ මහතා අදත් ප්‍රබලයි කියලා. ජනවාරි 08 වැනිදා පැරදුණ මහින්ද රාජපක්ෂ, මම දකින්නේ තවත් පරදින එක. නමුත් ඉස්සරහටත් සන්ධානයේ සභාපතිකම තියාගෙන ආවනම් තව යම් ප්‍රමාණයකින් ශක්තිමත්ව තමයි එන්නේ. එතකොට එකක් මම අයින් වෙන එක, එහෙම නැත්නම් අගමැති අපේක්ෂකත්වය නොදී ඉන්නවා කියලා කිව්වහම ඒගොල්ලෝ ඔක්කොම සැලසුම් කරලා තිබුණා වෙනම තරග කරන්න. අපේක්ෂක ලැයිස්තු හදලා, ප්‍රතිපත්ති ප්‍රකාශන කමිටු හදලා ඔක්කොම වැඩ අවසන් කරලා තිබුණේ, වෙනම පක්ෂයකින් තරඟ කරන්න.

එතකොට සන්ධානය තුළ නාම යෝජනා නොලැබුණානම් ඒගොල්ලෝ වෙනම පක්ෂයකින් පාර්ලිමේන්තුවට එනවා. එය වළක්වන්න පුළුවන්කමක් නැහැ.

දැන් මෙතනදී අහන අනෙක් ප්‍රශ්නය තමයි ඇයි එහෙමනම් සන්ධානයෙන් දුන්නේ විරුද්ධ වුණා නම් කියලා. මෙතනදී මම කාරණයක් කියන්න ඕනෑ. බොහෝම පහසුයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කෑල්ලක් කඩා ගෙන මට රට වටේ යන්න තිබුණා. හැබැයි ජනාධිපතිවරයකුට ගැළපෙන්නේ නැහැ පක්ෂයේ කෑල්ලක් කඩා ගෙන රට වටේ යන එක. අනිත් කාරණය තමයි ප්‍රධාන වශයෙන්ම මේ රටේ මැතිවරණ ඉතිහාසය, එක් එක් ආණ්ඩු සහ එක් එක් යුග ගත්තහම මේ රටේ තියෙන ද්වි පක්ෂ ක්‍රමය තමුන්නාන්සේලා අපි කවුරුත් පිළිගන්නවා. ඒ පක්ෂ දෙක තමයි හැමදාම ආණ්ඩු කරන්නේ. අනික් පක්ෂ සමහර විට සෘජුව එනවා. නැත්නම් වක්‍ර ව එනවා. එහෙම නැත්නම් මධ්‍යස්ථව එනවා. නමුත් 1956 ඉඳලා මේ රට පාලනය කරන්නේ එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. මේ ද්වි පක්ෂ ක්‍රමය තුළ මේ පක්ෂ දෙකෙන් කොයි එකක් හෝ කැඩිලා බිඳිලා දුර්වල වුණු හැම යුගයකදීම සිද්ධ වුණේ කුමක්ද. හැම යුගයකදීම සිද්ධ වුණේ මේ රටේ නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය අර්බුදයකට යාම. මම අනාගතය ගැන අනාවැකි කියන තාරකා විද්‍යාඥයකු හෝ ජ්‍යොතිෂඥයකුත් හෝ නොවෙයි.

මේ රටේ පසුගිය දශක පහක දේශපාලන ඉතිහාසය සමඟ එක්සත් ජාතික පක්ෂය 1970 මැතිවරණ ප්‍රතිඵලයෙන් බරපතල අර්බුදයකට ගියා. එක්සත් ජාතික පක්ෂය ආසන හතට අවට බැස්සා. ජේ. ආර්. ජයවර්ධන මහතා 1972දී බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුවට එන්න ඉල්ලීමක් කළා. ෆීලික්ස් ඩයස් මහතා ඇන්. එම්. පෙරේරා මහතා ඊට විරුද්ධ වුණා. නොඑසේ නම් ජේ. ආර්. ජයවර්ධන මහතා 1972 දී සිරිමාවෝ

බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුවේ ඇමැතිකමක් ගන්නවා. ඒ සිද්ධිය මට හොඳට මතකයි. එහිදී එක්සත් ජාතික පක්ෂය 1970 මහ මැතිවරණයෙන් බරපතල ලෙස දුර්වල වුණා. එහි ප්‍රතිඵලය වුණේ 1972 ව්‍යවස්ථාව තුළ අවුරුදු 05 කට බලයට පත් වූ ආණ්ඩුව තවත් අවුරුදු 2 ක් ඉස්සරහට යමින්, වසර 5ක් ව තිබූ කාලය වසර 7 ක් දක්වා වැඩි කර ගැනීමයි.

1971 කැරැල්ල හා රටේ එවකට තිබුණු ආර්ථික සමාජ පසුබිම සමඟ 1975දී මැතිවරණයක් තිබ්බා නම් එක්සත් ජාතික පක්ෂය $^{2}/_{3}$ක් ජයග්‍රහණය කරනවා. එහි දී ප්‍රබල විපක්ෂයක් හැදේවි. එජාපය බරපතල ලෙස දුර්වලවීමේ ප්‍රතිඵලය හැටියට පැවති ආණ්ඩුව තවත් වසර 2 ක් ඉස්සරහට බලය පවත්වා ගෙන ගියා. මගේ නායිකාව වූ බණ්ඩාරනායක මැතිණියට ඉතාම ගරු කරනවා. නමුත් ඒ සිදුවීමේ ප්‍රතිඵලය නිසා එක්සත් ජාතික පක්ෂය 1977දී $^{5}/_{6}$ක බලයක් ගත්තා. 1977දී $^{5}/_{6}$ ක බලයක් ලබා ගත් පක්ෂයකට 1975 මහ මැතිවරණයක් තිබ්බා නම් $^{2}/_{3}$ ක් ගන්න බැරි වෙන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂය $^{5}/_{6}$ ක් ගත් අවස්ථාවේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 08 කට බැස්සා. එහි ප්‍රතිඵලය විදිහට 1977 ජේ.ආර්. ජයවර්ධන මහතාගේ ආණ්ඩුව $^{5}/_{6}$ක බලයක් සහිතව අවුරුදු 12මක් ආණ්ඩු කළා. අපි මේ කතා කරන සමස්ත දේශපාලන අර්බුදය නිර්මාණය වුණේ ඒ තුළින්මයි.

අද අපි මේ පුද්ගලයෙක් ගැන කතා කරනවා. අද මහින්ද රාජපක්ෂ ගැන කතා කරනවා. මේක මහින්ද රාජපක්ෂ යන පුද්ගලයා පිළිබඳ අර්බුදයක් නොවෙයි. මෙහි දී පුද්ගලයා කියන

සංකල්පය නොව මේ සමස්ත අර්බුදය ම අරගෙන විග්‍රහයකට යන්න ඕනෑ. එතකොට $^5/_6$ ක් ආපු එක්සත් ජාතික පක්ෂය 77 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කළා. 1978 ව්‍යවස්ථාව ආවා. විධායක ජනාධිපති ධූරය. මේ අශීලාචාර මනාප ක්‍රමය, මේ රටේ දේශපාලන සංස්කෘතිය නැත්තටම නැති කළේ මේ මනාප ක්‍රමය. දේශපාලනඥයන්ට දොස් කියනවා ඇත්ත. වැරැදියි. දේශපාලඥයන් දැන ගන්න ඕනෑ අවංකව තමන්ගේ වැඩේ කරන්න. නමුත් ඒ අවංකභාවය ගිලිහී ගිහින් තිබෙන්නේ මේ ක්‍රමයට ඔරොත්තු දෙන්න හුඟ දෙනකුට බැරි නිසා. මම විශ්වාස කරනවා මම ඒ ක්‍රමයට ඔරොත්තු දුන්නා කියලා. මොකද මම අවුරුදු 26 ක් පාර්ලිමේන්තුවේ ඉඳලා, ඇමතිකම් කරලා මම දන්නවා මේ රටේ ජනතාව මා කෙරෙහි තබපු විශ්වාසය. වංචා, දූෂණ නැති බලය වැරැදියට පාවිච්චි කරපු නැති, කෙනෙක් විදිහට මාව පොදු අපේක්ෂකයා විදිහට භාර අරගෙන, මාව ජනාධිපති කිරීමට මේ රටේ ජනතාව මා කෙරෙහි විශ්වාසය තැබුවේ මේ ක්‍රමයට මම ඔරොත්තු දුන්න නිසා.

මට මතකයි ජනවාරි 8 වැනිදාට කලින් මැතිවරණ වේදිකාවේදී, මට විරුද්ධව එදා සන්ධානේ කථිකයන් කිව්වා මෛත්‍රීපාල සිරිසේනට පුළුවන්ද ජනාධිපති වෙන්න. ජනාධිපති වෙන්න කලින් පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක වෙන්න ඕනෑ. අගමැති වෙන්න ඕනෑ. අගමැති හෝ විපක්ෂ නායක වෙන්නේ නැතිව මේ රටේ කවුරුවත් ජනාධිපති වෙලා නැහැ කියලා. එහෙම තර්ක ඉදිරිපත් කළා.

මහින්ද රාජපක්ෂ මහතා තමයි මේ රටේ ජනාධිපතිවරුන්ගෙන් මැතිවරණයකට ඇවිල්ලා පරාජය වෙච්ච එකම ජනාධිපතිවරයා. අනිත් ජනාධිපතිවරු නම්බුව තියාගෙන වාර දෙක කරලා ගෙදර ගියා. එතුමා ඇවිල්ලා ඒ වාර්තාව බින්දා. ඒ ලංකාවේ පරාජය වෙච්ච පළමුවැනි ජනාධිපතිවරයා විදිහට.

රටක, ආයතනයක පුද්ගලයෙක් ගත්තහම අතීතයේ තොරතුරුත් එක්ක තමයි අනාගතය පිළිබඳව අනාවැකි කියන්න පුළුවන්. විශේෂයෙන්ම රටක ඉතිහාසයත් එක්ක ඒ රටේ ශිෂ්ටාචාරය, සංස්කෘතිය, රට ගොඩනැගුණු හැටි සියල්ල තියෙන්නේ. ඒ වගේම අපි මෑත ඉතිහාසය ගත්තහම මේ රටේ දේශපාලනයේ පසුගිය දශක පහක හයක ඒ ඇතිවෙච්ච සිද්ධීන් මම කිව්වේ. ඉතින් ඒක නිසා මට මෙතනදි උවමනාවක් ඇති වුණේ නැහැ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කඩලා කෑල්ලක් අරගෙන රට වටේ යන්න. පක්ෂයේ සන්ධානයේ නායකයන් සියල්ලම මහින්ද රාජපක්ෂ මහතාට අපේක්ෂකත්වය දෙන්න කිව්වා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමෙන් සියයට අනූනවයක්ම අපේක්ෂකත්වය දෙන්න කිව්වා. දැන් මම මෙතනදි කළ යුත්තේ කුමක්ද? මට තියෙන්නේ එහෙම නම් පක්ෂය කඩාගෙන අයින් වෙන්න. නැත්නම් ඉල්ලා අස්වෙන්න. එහෙම කළා නම්, සිදු වෙන්න තිබුණු ප්‍රතිඵල මොනවද කියලා මම කිව්වා. එහෙම නැත්නම් පැහැදිලිව මම මගේ ස්ථාවරය වෙනස් වුණේ නැහැ. මගේ විරුද්ධත්වය එසේමයි. මේ ගොල්ලන්ට ඒ විරුද්ධත්වය පළකළා. නමුත් මම කිව්වා පක්ෂය කඩා ගන්නෙ

නැතිව බහුතර තීන්දුව ගන්න කියලා. හැබැයි මම මේ තීන්දුවට එකඟ නැහැ.

ඒ නිසා මේ සෑම කාරණාවක්ම ගත්තහම මූලික වශයෙන් මේ තිබෙන පසුබිමත් එක්ක මට මේ චෝදනා කරන අයට මම කියන්නට ඕනෑ, 47 ක් මන්ත්‍රීවරුන්ගෙන් අගමැති කෙනෙක් පත් කරලා මම හය මාසයක් ආණ්ඩු අරගෙන ආපු හැටි. යහපාලනයේ දොරටු විවෘත කරපු හැටි. එතකොට ඒ පිළිබඳව මගේ මනසේ සැලසුම් ඒ විදිහටම මම ගෙනාපු හැටි. ඒ නිසා මම බොහෝම පැහැදිලිව කියන්නට ඕනෑ මේ ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රතිඵල තුළ මට අවශ්‍ය වෙන්නේ කුමන පක්ෂයෙන්ද කියන කාරණාව නෙවෙයි. පාර්ලිමේන්තුවට එන 225 න් වැඩි බහුතරයක් ජනවාරි 8 වැනිදා ලබපු ජයග්‍රහණය සහතික කරන, එම වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යන පාර්ලිමේන්තුවක් තමයි මට උවමනා වෙන්නේ. ඒක නිසා මගේ අරමුණ එතනයි තියෙන්නේ. ඒ අරමුණ ඉෂ්ට කර ගන්නයි මම කටයුතු කරන්නේ. ඉන් මෙහා මගේ ආපසු හැරීමක් නැහැ. මම සියලු දේවල් පූජා කරලා ආපු කෙනෙක් විදිහටයි නොවැම්බර් 21 වැනි ද එළියට බැස්සේ. ඒ විදිහට මහ මුහුදේ මහා සාගරයේ දරු පවුලත් එක්ක මහ මුහුදට පැන්නා වගේ දෙයක් මම කළේ. මම මේ මාස 06 ආණ්ඩුව අරගෙන ආවේ හරියට ටයිටැනික් නැව වගේ. ටයිටැනික් ගිලුණා. හැබැයි මම ගිලෙන්න දුන්නේ නැහැ. ආණ්ඩුව ගිලෙන්න එන කොට අගමැතිතුමාට ගෙනාපු විශ්වාසභංග යෝජනාව අල්ලලා මම පාර්ලිමේන්තුව විසිරෙව්වා. අගමැතිතුමාට ගෙනා විශ්වාසභංග යෝජනාවේ යටි අරමුණක්

වෙලා තිබුණේ ප්‍රධාන වශයෙන් විශ්වාසභංග යෝජනාව පාර්ලිමේන්තුවට ගන්න දින තීන්දු වුණා නම් සන්ධානයේ ජාතික ලැයිස්තුවෙන් කෙනෙක් ඉල්ලා අස් වෙලා, ඒ වෙනුවට මහින්ද රාජපක්ෂ මහතා පාර්ලිමේන්තුවට ගෙනත්, විශ්වාසභංග යෝජනාවෙන් රනිල් වික්‍රමසිංහ මහත්මයාව පරාජය කරලා, ආණ්ඩුවක් හදන්නයි ඒ ගොල්ලන්ගේ සැලැස්ම තිබුණේ. මම ඒවත් පරාජය කෙරුවා. මම ඒකයි කිව්වේ මේ 225 න් 47 ක් එක්ක ආණ්ඩුවක් අරගෙන ආපු හැටි. මැතිවරණ ප්‍රකාශනයේ කරුණු ඉෂ්ට කළ ආකාරය. ව්‍යවස්ථාව හා යෝජනා සම්මත කරපු හැටි. ඒ තුළින් ජනතාවට සහන දුන්නු හැටි. මේවත් එක්ක පක්ෂයේ අර්බුදවලට මම මුහුණ දුන්නේ කොහොම ද කියලා. මේ සියල්ල කළේ ජනවාරි 8 වැනි ද ලැබූ ජයග්‍රහණය තහවුරු කරන්න. බොහෝම පිරිසිදුව. අවංකව. ඒකයි මගේ අධිෂ්ඨානය හා පරමාර්ථය. ඒක නිසා මේ තත්ත්වය බොහෝම ප්‍රවේශමෙන් විග්‍රහ කරන අය විග්‍රහ කරනවා. විවේචන බොහෝම පහසුයි. විවේචනයට මම ජයවේවා කියලා කියනවා. ඒ ගැන මගේ කිසි ප්‍රශ්නයක් නැහැ. නිදහස් හා ප්‍රජාතන්ත්‍රවාදී රටකට විවේචන ඉතා අවශ්‍යයයි. නිදහස් මාධ්‍ය ඉතා අවශ්‍යයයි. ඒක මම හැමවෙලාවෙම සහතික කරනවා.

19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන්න ගිය මාධ්‍ය පිළිබඳ ඡේදය අයින් කෙරුවේ මමයි. ඒ නිසා මම මගේ වගකීම් මෙතෙක් ඉෂ්ට කරලා තියෙනවා. ඉදිරියටත් මම ඒ විදිහට ඉෂ්ට කරනවා. ඉදිරි මැතිවරණ ව්‍යාපාරය තුළ බොහෝම පැහැදිලිව මම කියන්නට ඕනෑ මහින්ද රාජපක්ෂ මහතා සමඟ මගේ ගනුදෙනුවක් නැහැ. මහින්ද රාජපක්ෂ මහතා ජනවාරි

8 වැනිදාට කලින් මගේ තිබ්බ විරෝධය අදත් එහෙමමයි. පාර්ලිමේන්තු මැතිවරණයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජනතා නිදහස් සන්ධානය ජයග්‍රහණය කරනවා නම් මහින්ද රාජපක්ෂ මහතා හැර ඕනෑතරම් ජ්‍යෙෂ්ඨයෝ ඉන්නවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අගමැති විදිහට පත් කරන්න. මහින්ද රාජපක්ෂ මහතා නායකයා විදිහට, ජනාධිපතිවරයා විදිහට ඉන්න කාලේ කිසිකෙනෙකුට ජනාධිපති වෙන්න ඉඩ නොදී ජනාධිපති ධූරයට තරග කරන වාර ගාණ අයින් කර ගත්තා. එතකොට එයාට සදාකාලිකව, ජීවත්ව ඉන්නකම් තරග කරන්න පුළුවන්. සීමිත නැහැ. එතකොට දැන් මේ මොකද කරන්න හදන්නේ. මේ පක්ෂයේ අගමැති විදිහට සුදුසුකම් තියෙන අනිත් අයට අගමැති ධූරය ලබා ගැනීමට ඇති අවස්ථාව නැති කරලා එතන්ට එන්න තමයි එයා ඉලක්ක කරන්නේ. මම බොහෝම පැහැදිලිව කියන්නට ඕනෑ මම මේ මැතිවරණ ව්‍යාපාරය තුළ බොහෝම පැහැදිලි මැදහත් පිළිවෙතකයි ඉන්නේ. ඒක නිසා ඉදිරි මැතිවරණ ව්‍යාපාරය නිදහස් හා ප්‍රජාතන්ත්‍රවාදී සාධාරණ මැතිවරණයක් ලෙස මේ රටේ පවත්වන්න මම මැතිවරණ කොමසාරිස්තුමාට. ආරක්ෂක අංශවලට සහයෝගය දෙනවා.

ඉදිරි මහ මැතිවරණයෙන් පස්සේ ජනවාරි 08 වැනිදා ලබපු ජයග්‍රහණය ඉදිරියට ගෙනිහිල්ලා, අවුරුදු 05 කට ජනතාවට දුන්නු පොරොන්දු ඉටු කරන්නයි බලාපොරොත්තු වෙන්නේ. අවුරුදු පහ යනකොට ඒ සහතිකය ජනතාවගෙන් හම්බවෙයි. මම පිළිබඳව කතා කරන අය නොයෙකුත් චෝදනා, දෝෂාරෝපණ, චෝදනා පත්‍ර එල්ල කරනවා. මම දන්නවා

2016 - 1

මේවා බොහෝ නුදුරු අනාගතයේ ඒවා පහ වෙලා යාවි. අවුරුදු 49 ක මගේ දේශපාලන අත්දැකීම් එක්ක මම බොහෝම සතුටින් ඒවාට මුහුණ දෙනවා. මේ රටේ කිසිම රාජ්‍ය නායකයකුට ගහපු නැති ආකාරයට පහුගිය දිනවල ගහපු ගැහිල්ල ගැන මම සතුටු වෙනවා. ඒ ප්‍රජාතන්ත්‍රවාදයේ මල් පිපෙන හැටි, ප්‍රජාතන්ත්‍රවාදයේ දෝරේ ගලා යන හැටි සහ එහි ප්‍රතිඵල ලබා ගන්නා හැටි දැකලා. මම බොහෝම ගෞරවයෙන් කියන්නේ මම ලබා දුන් නිදහස, ලබා දුන් ප්‍රජාතන්ත්‍රවාදය මේක වල් බූරු නිදහසක් කරගෙන විනාශ කර ගන්න එපා. භුක්ති විඳින්න කියන ඉල්ලීම මම කරනවා.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

REFERENCE

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව